# හාවා හඳේ



දම්කෙත් චේතුල බණ්ඩාරනායක

# හාවා හඳේ

දම්කෙත් චේතුල බණ්ඩාරනායක

**කතා**

**පළමු දිගහැරීම**

**ශ්‍රී චන්ද්‍රානන්ද බෞද්ධ විද්‍යාලය**

**3 වසර**

**2025.02.08**

ISBN 978-624-208-519

# පිදුම

මගේ ජීවිතේ වහලය
වගේ මාව ආරක්ෂා
කරන තාත්තාටත් ,

මා වටා ගොඩ නැගී
ඇති බිත්ති ය වගේ
මට රැකවරණය දෙන
අම්මාටත්,

මේ පොත
ආදරයෙන්
පිළිගන්වමි.....

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපී පෙනෙන්නේද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරදන අත්ථදස්සී මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන "**හෙරණගත්කරණී**" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය හා ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහනයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රත්ඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය- මහනුවර

ඔන්න එකෝමත් එක කාලෙක හා පුංචෙකුයි අලි පුංචෙකුයි හිටියා . එයාලා ගජ මිතුරෝ.

ඉස්කෝලේ ඇරිලා ඇවිත් හැමදාම මේ දෙන්නා සෙල්ලම් කළා . හති වැටෙනකම් සෙල්ලම් කළා. රෑ වෙනකම් සෙල්ලම් කළා .

දවසක් හා පැංචා ඉස්කෝලේ ඇරිලා ආවා.

කරන්න වැඩක් තිබුණේ  නැති නිසා  හා පුංචා කල්පනා කළා අලි පුංචා ව මුණ ගැහෙන්න යන්න.





එයා අලි පුංචා ගේ ගෙදර ගියා.

දෙන්නා කල්පනාවට වැටුණා අද මොකක්ද කරන සෙල්ලම කියලා.



"අපි ඔංචිල්ලාවක් හදමු " අලි පූංචා කිව්වා.



දෙන්නත් එක්ක එකතු වෙලා  ඔංචිල්ලාව හදන්න ඕනි කරන දේවල් හොයන්න ගත්තා .



අලි පුංචා ට දිග ලණුවකුත් හාවාට පොඩි ලෑල්ලකුත් හම්බ වුණා.

ඔංචිල්ලාව බඳින්න හොඳ ගහක් හොයාගෙන දෙන්නා ලොකු කන්දක් නැග්ගා.





කඳු මුදුනේ තිබුණු ගහක අත්තක ඔන්චිල්ලාව බැන්දා .



කොහොම හරි දෙන්නා එක්ක රෑ බෝ වෙනකම් ඔංචිලි පැද්දා. හා පුංචෝ මට නම් දැන් ඇති. අපි ගෙදර යමුද ? එහෙම ඇහුවේ අලි පුංචා.

අනේ තව එකම එක තල්ලුවක් දෙන්නකෝ.

ලොකු එකක්...


එහෙම කිව්වේ හා පුංචා.

හරි...එහෙනම් එකම එකක්. ඔන්න හයියෙන් අල්ල

ගන්න....කියල අලි පුංචා පස්සට පස්සට , තවත් ටිකක් පස්සට

ඇදල අත ඇරියා..





" අම්මෝ....හා  පුංචා වේගයෙන් අහසට නැග්ගා .

හා පුංචා අහසට වීසි වෙලා ගියා.

කැරකි කැරකි අහසට වීසි වුණා. තව තවත් ඈතටම ගියා.

අන්තිමට හා  පුංචා නතර වුනේ වෙන ග්‍රහ ලෝකයක.

ඒ තමයි හඳ .

එදා ඉඳන් තමා හාවා හඳේ ඉන්නේ ......

එදා අලි පුංචා දාපු තල්ලුව නිසා නේද මට මෙහෙම වුණේ "

කියලා දුක් වෙමින් ඉන්න හා පුංචා ව මං වගේම ඔයාලාත්

දැකලා තියෙනවා නේද ?

කතාව නිමි .



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප් නැංවීම හා එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමකි. පාසලක් මුල් වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාවය වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමි විය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබා දිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක් වීමත් සමග දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටළු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙන යාමට මහාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසග, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මාගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,

සෙනෙවිරත්න මහලේකම්

ISBN 978-624-208-519-7